# ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව
## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# පුරප්පාඩු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ගණකාධිකාරි තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**(I) ගණකාධිකාරි** – (MM 1-1)

**සුදුසුකම් :**

**බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජ හෝ ගිණුම්කරණය පිළිබඳ උපාධියක්

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (ICASL) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම

**හෝ**

ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA)

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර තුනක (03) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**සටහන : පරිගණකගත පරිසරයක පළපුරුද්දක් තිබීම විශේෂ වාසියකි.**

**සේවක කාණ්ඩයේ වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය**

* MM 1-1- 2025 රු. [91,690- 10X2,480- 15X3,450-රු.168,240]

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 01/2025 චක්‍රලේඛය මත පදනම්ව වැටුප් ගෙවනු ලැබේ)

**වයස** : වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවෙකුම :**

I. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය

II. තනතුරේ රාජකාරි මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

III. විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය :**

අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල සහතික කළ පිටපත්, සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපින ඇතුළත් අවශ්‍ය තොරතුරු සපයන අයදුම්පතක් හෝ ජීව දත්ත සටහනක් (CV) සමඟ ආවරණ ලිපිය **සභාපති, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07** යන ලිපිනයට යොමු කළ යුතුය. මෙම අයදුම්පත් 2026.10.27 දින හෝ ඊට පෙර SLCARP වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අයදුම්පත්, අදාළ තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරුට සේවයෙන් නිදහස් විය හැකිද යන්න පැහැදිලිව සඳහන් කරමින් නිසි මාර්ග හරහා යොමු කළ යුතුය.

කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ගණකාධිකාරි තනතුර සඳහා අයදුම්පත**" ලෙස සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දිනට පසුව ලියාපදිංචි තැපැලෙන් එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,**
**අංක 114/9, විජේරාම මාවත,**
**කොළඹ 07.**